# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

## නාට්‍ය හා රංගකලාව කාලය : පැය 2

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් A, B, C, D, E, කොටස් ඇසුරින් අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි

B මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත්ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්

C කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා

D "ඔබ වහන්සේගේ මළනුවන්ගේ කීමටයි මම මේ ආවේ. ඔබ වහන්සේගේ යෙල කපලා මරන්න කීවේ ඔබ වහන්සේගේ මළණුවන්මයි."

E පුංචි අපේ කතන්දරේ
කුකුල් හාමි කෙනෙක් වෙතයි
මී හාමිලා හතර දෙනයි
වත්තේ මල් ගස් මෙඅපයි

(1) හඬ අභ්‍යාස සඳහා ඔබ පංති කාමරයේ පුහුණු වූ රබන් පදය අයත් වන්නේ,

i) C ය  iii) A ය
ii) B ය  iv) E ය

(2) D කොටසෙහි දැක්වෙන සංවාදය අයත් ජනකතාව වන්නේ,

i) නාඩි බැලීම  iii) පුහුල් හොරා කරෙන් දැනේ
ii) අනුන්ට කැපූ වලේ තමන් වැටීම  iv) ගමරාළ දිව්‍යලෝකේ ගියා වගේ

(3) නරියෙක්, ගමදුවක්, කැලෑවක් විස්තර වන නාට්‍යයකට අයත් ගීතය වන්නේ,

i) B ය  iii) C ය
ii) A ය  iv) E ය

(4) ඔබ නාට්‍යයක් නිර්මාණය කිරීමට පාදක කරගත් කවියකි.

i) A ය  iii) E ය
ii) C ය  iv) B ය

(5) E කොටසෙහි සඳහන් ගීතය අයත් ළමා නාට්‍ය වන්නේ,

i) අමර ගියා දිව්‍ය ලෝකෙ  iii) පංචි අපට දැන් තේරෙයි
ii) නෙලුම් කුමාරි  iv) වළහා සහ මාෂා

- **ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(6) රිය අනතුරකදී දැකිය හැකි භාව ප්‍රකාශනයක් නොවේ.

i) සතුට iii) පුදුමය

ii) කුතුහලය iv) ශෝකය

(7) අධි මානුෂීය චරිතයක් නොවේ.

i) දෙවියා iii) ගුරුවරයා

ii) සුරංගනාව iv) යක්ෂයා

(8) අනුශාංගික කලාවක් නොවේ.

i) සංගීතය iii) නළු නිළියන්

ii) ආලෝකකරණය iv) රංග වස්ත්‍රාභරණ

(9) සත්ව චරිතයක් අනුකරණය කිරීමේදී සැලකිය යුතු කාරණයක් නොවේ.

i) සතාගේ ප්‍රමාණය iii) සතාගේ අලංකාරය

ii) සතාගේ හැසිරීම iv) සතාගේ හඬ

(10) නාට්‍යයක් නැරඹීමෙන් ලබාගත නොහැක,

i) සතුට iii) ආදර්ශය

ii) විනෝදය iv) වෛරය

- **ගැලපෙන පරිදි යා කරන්න.**

| | 'අ' කොටස | 'ආ' කොටස |
|---|---|---|
| (11) | නාට්‍යයෙන් කියවෙන අදහස | පරිකල්පනය |
| (12) | තවත් අයෙකු අනුව කටයුතු කිරීම හෙවත් ක්‍රියා කිරීම | ශ්වසන අභයාස |
| (13) | රංගනයේදී යොදා ගන්නා උපකරණය | අනුකරණය |
| (14) | සිතින් මවා ගැනීමේ හැකියාව | තේමාව |
| (15) | හඬ පාලනයට ඉවහල් වේ. | නාට්‍යෝපකරණය |

- **හිස්තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

(16) කටහඬ පුහුණුව සඳහා ............................................ කියවීම වැදගත් වේ.

(17) පෙර සූදානමකින් තොරව යමක් කිරීම ............................................ යි.

(18) 'පුංචි අපිට දැන් තේරෙයි' නාට්‍යයේ ප්‍රධාන චරිතය ............................................ ය.

(19) නාට්‍යෝපකරණ අයත් වන්නේ ............................................ ටය.

(20) සත්ත්ව චරිතයකි. ............................................

(වලහා, කුකුළු හාමි, ආහාර්ය අභිනය, අතිමානුෂික, ක්ෂණික නිරූපණය, දෙබස්)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**

01. පහත සංවාද කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුකුල් හාමි - කවුදැයි කවුදැයි කරල ගෙනාවේ ?
හතර දෙනාම - කුකුල් හාමි නොවැ කරල ගෙනාවෙ
කුකුල් හාමි - කව්දැයි වී ටික කොටල ගෙනාවේ
හතර දෙනාම - (ඉතා උද්යෝගීමත්ව) කුකුල් හාමි නොවැ කොටල ගෙනාවේ. මෝලට ගොස් වී කොටල ගෙනාවේ

i) මෙම සංවාද (දෙබස්) කොටස අයත් වන නාට්‍යයේ නම කුමක්ද? (ල. 2)
ii) එහි අධ්‍යක්ෂකයා කවුද? (ල. 2)
iii) එහි චරිත තුනක් නම් කරන්න. (ල. 2)
iv) මෙම අවස්ථාවේදී මෙහි සිටින අය සෑදීමට සූදානම් වන්නේ කුමන ආහාරයක්ද? (ල. 2)
v) මෙහි ඇතුළත් රංග විධානයක් ලියන්න. (ල. 2)

02.
i) නාට්‍ය යනු කුමක්ද? (ල. 2)
ii) නාට්‍ය පිටපතක ඇති ලක්ෂණ තුනක් ලියන්න. (ල. 2)
iii) කතාන්දරයක් සහ නාට්‍යයක් අතර ඇති සමාන හා අසමානතා ලක්ෂණ 5ක් ලියන්න. (ල. 6)

03.
i) අනුකරණය යනු කුමක්ද? (ල. 4)
ii) ඔබ අනුකරණය කළ සත්ත්ව චරිතයක් සඳහා ගැලපෙන රංග වස්ත්‍ර හා ආභරණ ඇඳ දක්වන්න. (ල. 6)

04. පහත සඳහන් මාතෘකාවන්ගෙන් එකක් තෝරා ගෙන කවි පන්තියක් හා චිත්‍රයක් නිර්මාණය කරන්න. (ල. 10)

i) හිමිදිරි උදෑසන
ii) වැස්ස
iii) සඳ පෑයීම

05. ඔබ දන්නා ජන කතාවක් ඇසුරින් නාට්‍ය පිටපතක් සකස් කරන්න.

- චරිත, සංවාද, රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල. 4)
- ආදර්ශමත් නිමාව (ල. 6)